2024. 01. 14 අරුණ පිටුව 6.

# ජන හා නිවාස සංගණන මූලික වාර්තාව පෙබරවාරියේ

සාලිය කුමාර ගුණසේකර

මෙවර ජන හා නිවාස සංගණනයේ මූලික වාර්තාව (සාරාංශ වාර්තාව) පෙබරවාරි මාසයේ පළමු සතියේදී නිකුත් කිරීමට බලාපොරොත්තු වන බව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් අනූජා සෙනෙවිරත්න පැවසුවාය.

මෙවර ජන සංගණනයේ කටයුතු මේ වනවිට සියයට 98 ක් පමණ අවසන් බවද ඇය කියා සිටියාය.

කොළඹ සහ ගම්පහ යන දිස්ත්‍රික්කවල ප්‍රදේශ කීපයක පදිංචිකරුවන් සුළු පිරිසකගේ තොරතුරු මේ දිනවල ලබාගනිමින් සිටින බවද,අනෙකුත් දිස්ත්‍රික්කවල පදිංචිකරුවන්ගේ තොරතුරු ලබාගෙන අවසන් බවද ඇය පැවසුවාය.

පසුගිය සංගණනවලදී මෙන් මෙවර එක් දිනකදී රාත්‍රී කාලයේ සංගණන කටයුතු සිදු නොකළ බවද ඇය සඳහන් කළාය. එමෙන්ම,අදියර හතරක් යටතේ මෙවර සංගණන කටයුතු සිදුවූ බවද අධ්‍යක්ෂ ජනරාල්වරිය කීවාය.

පෙබරවාරි මස මූලික සතියේදී නිකුත් කිරීමට නියමිත සාරාංශ වාර්තාවට දිස්ත්‍රික්ක අනුව සමස්ත ජනගහනය ඇතුළත් කෙරෙන බවද ඇය පැවසුවාය.